# ප්‍රාදේශීය ටෙන්ඩර් දැන්වීමයි.

## වත්කම් බදු දීම – 2025 වර්ෂය

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් පහත උපලේඛණයේ සඳහන් දේපළ 2025.01.01 දින සිට 2025.12.31දින දක්වා වර්ෂයක කාල සීමාවකට බදු දීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 2024.12.24 දින ප.ව. 3.00 දක්වා භාර ගනු ලබන අතර 2024.12.26 දින පෙ.ව 10.30 ට මෙම කාර්යාලයේදි ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ.

02.ටෙන්ඩර් පෝරම 2024.12.10 දින සිට 2024.12.24 දින ප.ව. 3.00 දක්වා මෙම කාර්යාලයේදි ලබා ගත හැක.

03. ටෙන්ඩර් පෝරම ලබා ගැනිමේදී ටෙන්ඩර්කරු විසින් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කල යුතුය.

04.වැඩි විස්තර සතියේ දින වල කාර්යාලයට පැමිණ හෝ 041-2240208 යන දුරකථන අංකය ඇමතීමෙන් විමසා දැන ගත හැකිය.

05. තෝරා ගත් ලංසුකරුවන්ගේ ටෙන්ඩරයේ සඳහන් වන මුදල එකවර හෝ මාසිකව ගෙවිම් කළ හැකිය.

- පොදු වෙළඳපොළ සඳහා ලංසු මුදලෙන් ¼ ක ආරක්ෂිත ඇපයක් අය කරනු ලැබේ.
- තෝරා ගත් ලංසුකරුවන්ගේ ටෙන්ඩරයේ සඳහන් වන මුදලට අතිරේකව ටෙන්ඩර් වටිනාකමින් සෑම රු.1000.00 ක් හෝ ඉන් කොටසකට රු.10.00 බැගින් වූ මුද්දර බද්දක් එකවර ගෙවා ගිවිසුම් ගත විය යුතුය.

| අනු අංකය | විස්තරය | අවම ලංසුව | තැන්පත් මුදල | පෝරම ගාස්තු |
|---|---|---|---|---|
| 01. | තෙලිජ්ජවිල පොදු වෙළඳ පොළ | 640500.00 | 10 000.00 | 250.00 |
| 02. | මාලිම්බඩ පොදු වෙළඳ පොළ | 300000.00 | 5000.00 | 250.00 |
| 03. | හොරගොඩ පොදු වෙළඳ පොළ | 10000.00 | 1500.00 | 250.00 |
| 04. | ශාන්තිවත්ත ඉඩම | 5000.00 | 500.00 | 250.00 |
| 05. | සෙන්ට්‍රල් පාක් ඉඩමේ කුරුදු එලදාව | 50000.00 | 1000.00 | 250.00 |
| 06. | පරණවත්තහේන ඉඩම | 2500.00 | 500.00 | 250.00 |
| 07. | තෙලිජ්ජවිල පොදු වැසිකිලි පද්ධතිය | 2500.00 | 500.00 | 250.00 |
| 08. | මාලිම්බඩ පොදු වැසිකිලි පද්ධතිය | 1500.00 | 250.00 | 250.00 |
| 09. | නැටැව්වත්ත ඉඩම | 5000.00 | 500.00 | 250.00 |

2024.12.26 දින මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

ලේකම්,
ප්‍රසම්පාදන කමිටුව,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

# <u>උපදෙස් හා කොන්දේසි</u>

01. ලංසු පත් ලබා ගැනීම පිණිස ඉදිරිපත් වන අය අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස හැඳුනුම්පත හෝ පිළිගත හැකි සාධක ඉදිරිපත් කළ යුතුය.

02. ටෙන්ඩර් ඉල්ලුම්පත් පිළියෙල කර එවිය යුත්තේ ටෙන්ඩර් ඉල්ලුම්පත් සම්බන්ධයෙන් මෙයට යා කර ඇති උපලේඛනයේ සඳහන් තැන්පත් මුදල හා නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු කාර්යාලයට ගෙවා ලබා ගන්නා නියමිත පෝරම වලය.

03. එක් එක් දේපල සඳහා වෙන් වෙන් වශයෙන් ලංසු ඉදිරිපත් කළ යුතුය.

    i. අංක 01, 02, 03 සඳහා මාසිකව ගෙවිය හැකි අතර අනෙක් සියලුම ටෙන්ඩර් වල සඳහන් මුදල එකවර ගෙවා ගිවිසුමකට එළඹිය යුතුය.

04. උපලේඛනයේ සඳහන් ලංසුට අඩුවෙන් ලංසු ඉදිරිපත් කරනු ලැබුවහොත් ලංසු ඇප සභාව සතු කරනු ලැබේ.

05. ලංසුකරු ටෙන්ඩර් කැඳවනු ලබන දේපළ සම්බන්ධයෙන් හෝ වෙනත් බලපත්‍ර ගාස්තුවක් සම්බන්ධයෙන් හෝ සභාවට ගෙවිය යුතු ගාස්තුවක් නොගෙවා පැහැර හැර ඇති අයෙකුට ටෙන්ඩර් පොර්ම නිකුත් කරනු ලැබේ.

06. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද ලංසු ප්‍රතික්ෂේප කරන අතර ඇප මුදල සභාව සතු කරනු ලැබේ. ටෙන්ඩර් ඉල්ලුම් පත් වල සියලුම මකා දැමීම වෙනස් කිරීම ඉල්ලුම්කරුගේ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතුය.

07. ලංසු විවෘත කරන අවස්ථාවේ දී ඉල්ලුමකරුගේ පැමිණීම අපේක්ෂා කෙරේ.

08. ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හා ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.

09. වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළ දී මෙ කාර්යාලයට පැමිණ හෝ දූරකථනයෙන් (041-2240208)

10. නියමිත කාලය තුළ දී  මාසික බදු මුදල් නොගෙවා පැහැර හැරියහොත් කිසිදු වන්දියක් බදුකරුට නොගෙවා බද්ද අවලංගු කිරීමටත් හිඟ බදු මුදල් අය කර ගැනීමටත් සම්පූර්ණ බලය මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සභාපති තසතු වේ.

11. තොරා ගත් ලංසුකරුවන්ගේ ටෙන්ඩරයේ සඳහන් වන මුදලට අතිරේකව ටෙන්ඩර් වටිනාකමින් සෑම රු.1000/- ක් හෝ ඉන් කොටසකට රු.10/- බැගින් වූ මුද්දර බද්ද එකවර ගෙවා ගිවිසුම් ගත විය යුතුය.

12. ලංසු පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත අදාල ගිවිසුම් පත් අත්සන් කිරීම පැහැර හරිනු ලැබුවහොත් ටෙන්ඩරය අවලංගු කර ලංසු ඇප මුදල් සභාව සතු කරනු ලැබේ.

13. ලංසු පිටපත් දෙකකින් යුක්තව සම්පූර්ණ කර කවර දෙකක බහා වම්පස කෙළවරේ “මුල්පිටපත" "අනුපිටපත" යනුවෙන් සඳහන් කර එම කවර දෙකම වෙනත් කවරයක බහා වමපස ඉහළ කෙළවරේ ටෙන්ඩරයේ නම සඳහන් කර "ලේකම්, ප්‍රසම්පාදන කමිටුව, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව, මාලිම්බඩ." යන ලිපිනයට 2024.12.24 වන දින ප.ව.3.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි  තැපෑලෙන් හෝ මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ලංසුපත් භාලන පෙට්ටියට බහාලිය හැක.

2024.12.26
මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

ලේකම්,
ප්‍රසම්පාදන කමිටුව,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව